[Limited Sharing]

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සැපයීම**

**2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග යටතේ ලියාපදිංචි සහතිකයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය**

2005 අංක 28 දරන ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනතේ (පනත) විධිවිධාන අනුව නිකුත් කරන ලද 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග 2024.04.30 දිනැති අංක 2382/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර එම නියෝග 2024.06.03 දින සිට බලපැවැත්වෙයි. (නියෝග)

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව එකී මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ගේ නියාමන සහ අධීක්ෂණ අධිකාරිය ලෙස ක්‍රියා කරන අතර, සමස්ත මූල්‍ය අංශයේ සුරක්ෂිතභාවය හා ශක්තිමත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා එම සේවා සපයන්නන්ගේ නියාමනය සහ අධීක්ෂණය සඳහා වගකීම දරයි.

මෙම නියෝගයන්හි "මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා" යන්නෙන් මුදල්, චෙක්පත්, වෙනත් මූල්‍ය උපකරණ හෝ අනෙකුත් අගය රාශිගත උපකරණ ආකාරයෙන් මුදල් භාරගන්නා සහ එම වටිනාකමට අනුරූප මූල්‍යමය අගයක් මුදලින් හෝ වෙනත් ක්‍රමවේදයකින් ගෙවීම සඳහා සන්නිවේදනය, පණිවිඩය, පැවරීම හෝ මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන්නා අයත් වන නිෂ්කාශන ජාලය හරහා සිදු කරන මූල්‍ය සේවාවන් අදහස් වේ. එවැනි ගනුදෙනු සඳහා අතරමැදියකු හෝ වැඩි ගණනක් සම්බන්ධ වීමට හැකි අතර තෙවන පාර්ශවයකට සිදු කරන අවසාන ගෙවීමක් ද විය හැකිය. එසේම, එය ශ්‍රී ලංකාව තුළ යම් ස්ථානයකින් තවත් ස්ථානයකට හෝ ශ්‍රී ලංකාවෙන් වෙනත් රටකට හෝ වෙනත් රටකින් ශ්‍රී ලංකාවට විය හැකිය.

එම නියෝග අනුව, මහ බැංකුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකයක අධිකාරිය යටතේ සහ ලියාපදිංචි සහතිකයේ සඳහන් නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව හැර, කිසිදු තැනැත්තෙකු මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස හෝ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සැපයුම් ව්‍යාපාරයේ නිරත නොවිය යුතුය. එබැවින්, පහත සඳහන් නිර්ණායක අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරනු ලබන ලියාපදිංචි සහතිකයක් සඳහා ඉල්ලුම් කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන හෝ සැපයීමට අදහස් කරන සුදුසුකම් ලත් පුද්ගලයන් හට දැනුම් දෙයි. දැනටමත් එම සේවා සපයන්නන් 2025.06.02 වන විට ලියාපදිංචි සහතිකයක් සඳහා ඉල්ලුම් කළ යුතුය.

**1. අයදුම්කරුවන් විසින් සුදුසුකම් ලත් පුද්ගලයෙකු වීම සඳහා සම්පූර්ණ කළ යුතු නිර්ණායකයන් සහ අනෙකුත් නියමයන් සහ කොන්දේසි වනුයේ:**

i) 2007 අංක 7 දරන සමාගම් පනතෙහි අර්ථ නිරූපණය කෙරෙන, ඇපකරයෙන් සීමිත සමාගමක්, අක් වෙරළ සමාගමක් හෝ විදේශීය සමාගමක් හැර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති අවම වශයෙන් රුපියල් මිලියන විස්ස (20) ක හායනය නොවූ ප්‍රාග්ධනයක් හෝ මහ බැංකුව විසින් නියම කරන ලද වෙනත් ප්‍රමාණයක හායනය නොවූ ප්‍රාග්ධනයක් ඇති සමාගමක් වීම.

ii) මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ගේ ව්‍යාපාර හා කටයුතු පමණක් සිදු කිරීම.

iii) මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සැපයීම සඳහා පද්ධතියක් හෝ මනාව නිර්වචනය කරන ලද යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම/ක්‍රියාත්මක කිරීම.

**2. අයදුම් කිරීමේ ක්‍රියා පටිපාටිය**

2.1. සුදුසුකම් ලත් පුද්ගලයින් විසින් නිසි පරිදි පුරවන ලද අයදුම්පත් (https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/psd_mvts_application_form_s.docx හි ඇති) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

අධ්‍යක්ෂ,
ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහා බැංකුව,
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

[Limited Sharing]

2.2 අයදුම්කරුවන් සඳහා උපදෙස්

i) අයදුම්පත එවනු ලබන ලියුම් කවරයෙහි වම්පස ඉහල කෙළවරෙහි "**මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ලියාපදිංචිය සඳහා වන අයදුම්පත**" යනුවෙන් සඳහන් කිරීම අවශ්‍ය වේ.
ii) එවනු ලැබූ අයදුම්පත ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිළිගත් බවට කරනු ලබන දැනුම්දීමකින් පසුව එම අයදුම්පතෙහි දක්වා ඇති පරිදි ලියාපදිංචි ගාස්තුව වශයෙන් රුපියල් 50,000/- ක් ගෙවිය යුතුය.

3. ඉහත 1 හි දැනට ඇතුළත් කර ඇති නියමයන් සහ කොන්දේසි වලට අමතරව වෙනත් නියමයන් සහ කොන්දේසි වරින් වර ඇතුලත් කිරීමට හා මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස ව්‍යාපාර කටයුතු වල නියුක්ත වීමට හෝ ක්‍රියා කිරීම සඳහා ලියාපදිංචි වීමට අයදුම්කරුගේ යෝග්‍යතාවය තීරණය කිරීමට සහ අයදුම්පත් භාර ගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව හට කිසිදු හේතුවක් නොදක්වා ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය.

4. මහ බැංකුව හෝ වෙනත් නියාමකයෙකු හෝ රාජ්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද වෙනත් බලපත්‍රයක්, අවසර පත්‍රයක් හෝ බලය පැවරීමක් යටතේ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙකු ලෙස දැනටමත් ක්‍රියා කරන හෝ එසේ නියුක්ත වීමට හෝ ක්‍රියා කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයෙකුට මෙම නියෝගයන්හි විධිවිධාන අදාළ නොවේ.

වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා, දුරකථන අංක: 0112-477642 සහ විද්‍යුත් තැපෑල: mvts@cbsl.lk ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගත හැකිය.

**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**☎ 0112-477642 mvts@cbsl.lk**